**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන - හයවන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2015**

**තුලනාත්මක අධ්‍යාපනය – ESU4216**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2015 අප්‍රේල් 06** **වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. කෝල්බෲක් කොමිසම විසින් කරන ලද අධ්‍යාපනයට සම්බන්ධ නිර්දේශ තුනක් (03)කෙටියෙන් පැහැදිලි කරන්න.

02. දකුණු අප්‍රිකාව විසින් 1948 දී ක්‍රියාවට නංවන ලද වර්ණභේද ප්‍රතිපත්තිය හා සම්බන්ධ පනත් තුනක් (03) නම් කරන්න.

03. සංවර්ධනය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

04. 1944 බට්ලර් පනතට අනුව හඳුන්වා දුන් ත්‍රිභේදිත පාසල් ක්‍රමයට එල්ල වූ විවේචන තුනක් (03) දක්වන්න.

05. කන්නන්ගර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් සිදු වූ යහපත් ප්‍රතිඵල දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

06. 1972 දී ප්‍රාග් වෘත්තිය විෂයය හඳුන්වා දීමේ අරමුණු තුනක් (03) දක්වන්න.

07. ජාත්‍යන්තරීකරණය නිසා ශ්‍රී ලංකාවට අත් වී ඇති අවාසි දෙකක් (02) පැහැදිලි කරන්න.

08. අනිවාර්ය අධ්‍යාපන ඉලක්ක ඉටුකර ගැනීමේ දී ශ්‍රී ලංකාවේ මුහුණ දෙන බාධක තුනක් (03) දක්වන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. i. ග්‍රාමීය අධ්‍යාපනය යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. ග්‍රාමීය අධ්‍යාපන ක්‍රමය මගින් අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08)

iii. අධ්‍යාපනය හා වැඩලෝකය ගලපාලිම සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සිදුකළ යුතු වෙනස්කම් මොනවාදැයි යෝජනා කරන්න. (ලකුණු 08)

10. i. පැරණි අධ්‍යාපනයේ පැවැති ඉගැන්වීම් ක්‍රම මොනවා දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. පැරණි අධ්‍යාපන ක්‍රමයේ ප්‍රබලතා හා දුබලතා දෙක බැගින් විමසන්න. (ලකුණු 08)

iii. "පැරණි අධ්‍යාපන ක්‍රමය තුළින් සමාජ සචලතාවක් සිදුවිය." ඉහත ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 08)

11. i. වර්තමාන ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන අධ්‍යාපනික ගැටලු හතරක් (04) ක් නම් කරන්න. (ලකුණු 04)

ii. ඉහත ගැටලු විසඳීම සඳහා ශ්‍රී ලංකාව දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග විමසන්න.(ලකුණු 08)

iii. සම අධ්‍යාපන අවස්ථා දියුණු කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 08)

12. i. තුලනාත්මක අධ්‍යාපනය විෂයයේ සුවිශේෂී අරමුණු දෙකක් (02) දක්වන්න. (ලකුණු 04)

ii. බහුවිධ සමාජ ඇතිවීමට බලපාන සාධක නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. බහුවිධ සමාජයක දක්නට ලැබෙන අධ්‍යාපන ගැටලු දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iv. ඉන් එක් ගැටලුවක් අවම කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.(ලකුණු 04)

13. i. එංගලන්තයේ ද්විතියික අධ්‍යාපන ක්‍රමයේ ක්‍රියාත්මක වන විශේෂ පාසල් වර්ග මොනවා ද?

(ලකුණු 04)

ii. අධ්‍යාපනයේ සාධාරණත්වය ඇති කිරීම සඳහා එංගලන්තය ගෙන ඇති ක්‍රියා මාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 08)

iii. හානිපූරක අධ්‍යාපන සංකල්පය ශ්‍රී ලංකාවට ආදේශ කළ හැකි ආකාරය විස්තර කරන්න.

(ලකුණු 08)

14. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ලන්දේසි අධ්‍යාපන ක්‍රමයේ විශේෂ ලක්ෂණ

ii. පැරණි ශ්‍රී ලංකාවේ කාන්තා අධ්‍යාපනය

iii. පාසලින් ළමුන් ගිලිහීමට බලපාන සාධක

iv. සංවර්ධිත රටවල අධ්‍යාපනයේ නව ප්‍රවණතා

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.